**රත්නපුර මහා නගර සභාව - 2021**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිකිරීම් කර්මාන්තවලට අදාල ප්‍රාග්ධන ආදායම රු. 4,190,211 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් මඟින් ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්තවලට අදාල ණයහිමි වෙන්කිරීම රු. 1,280,000 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | දෙමුවාවත මැණික් වෙළඳ සංකීර්ණයේ සමාලෝචිත වර්ෂයට අදාල කුලී ආදායම රු. 930,237 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථවලින් අයවිය යුතු පිවිසුම් ගාස්තුව රු. 968,900 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ගිණුමේ ශේෂය රු. 58,103,614 ක් වුවද, සේවක ණය උපලේඛනය අනුව එම ශේෂය රු. 45,280,974 ක් වූයෙන් රු. 12,822,640 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් උපයෝගී ලේඛනවල ශේෂයන් සමඟ සැසඳිය යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික | 2003 වර්ෂයේ සිට 2019 වර්ෂය | ඉදිරියේදී මුදල් | මුදල් රෙගුලාසි |

| | | |
|---|---|---|
| සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) | දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල පොදු වෙළඳපල ඇප තැන්පත්, මහජන පොල ඇප තැන්පත්, ටෙන්ඩර් ඇප තැන්පත්, විවිධ තැන්පත් සහ වාණිජ භූමි කුලියට දීමේ ඇප තැන්පත්වලට අදාල එකතුව රු. 20,299,136 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි 571(2) අනුව කටයුතු කරන බව. | ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 61,809,296 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 89,516,437 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයේ රජයේ ආයතන 450 කට අදාලව රු. 2,501,156 ක හිඟයක් හා පෞද්ගලික ඒකක 21,983 කට අදාලව රු. 36,980,737 ක හිඟයක් වශයෙන් වරිපනම් ඒකක 22,433 කට අදාලව රු. 39,481,893 ක හිඟයක් අයකර ගැනීමට අපොහොසත් වී තිබූ තිබුණි. | වරිපනම් අංශයේ ඇති වසර 25 ක් පමණ පැරණි මෘදුකාංගය මඟින් කාල විශ්ලේෂණය ලබා ගැනීමට හැකියාවක් නොමැති බවත්, කොරෝනා වසංගතයේ බලපෑම හේතුවෙන් බදු නිසියාකාරව එකතු කිරීමට නොහැකි වූ බව. | සභාවට ලැබිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| දෙමුවාවත මැණික් අලෙවි කුටි සංකීර්ණයේ කඩකාමර බදු දීමේදී අවම ප්‍රදාන මුදල ගෙවා බදු ගිවිසුමකට එළඹීමේ අවශ්‍යතාවය දක්වා තිබුණද, කඩකාමර 10 ක් සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2016 අගෝස්තු 18 දිනැති එකඟතා ගිවිසුමක් | අවම ප්‍රදාන මුදල් නොගෙවන ලද කඩකාමර සඳහා මාසිකව මුදල් ගෙවිය යුතු ආකාරයට කාල රාමුවක් සකස් කර ලිපි මඟින් දැනුම් දී ඇති බව. | බදුකරුවන් සමඟ විධිමත්ව ගිවිසුම්ගත වීමටත්, සභාවට ලැබිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

ප්‍රකාරව සභාව නියම කර ඇති අවම ප්‍රදාන මුදලින් සියයට 50 ක මුදල දෙවන පාර්ශවය විසින් එකවර ගෙවිය යුතු අතර, ඉතිරි සියයට 50 මුදල වාරික වශයෙන් වසරක් තුල එනම්, 2016 ඔක්තෝබර් 31 දිනට හෝ ගෙවා නිම කිරීමට බදුකරු එකඟ වී තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වනවිටත් කඩකාමර 10 කට අදාලව අවම ප්‍රදාන මුදල් රු. 7,653,372 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 අප්‍රේල් 20 දින වැඩ නිමකල මහා නගර සභා "බ්ලු සපායර්" රැස්වීම් ශාලාව නවීකරණය කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් 2021 ඔක්තෝබර් 28 දින විගණනය විසින් භෞතික පරීක්ෂාවක් සිදුකල අතර, එහිදී අනාවරණය වූ පරිදි ඇස්තමේන්තුවේ විෂයය අංක 05 යටතේ ඉටුකර තිබූ සිවිලිම සැපයීම සහ සවිකිරීම වෙනුවෙන් රු. 62,674 ක්ද, SSR-01 යටතේ ඉටු නොකල කාර්යයක් වෙනුවෙන් රු. 14,761 ක්ද, SSR-04 යටතේ ඉටු නොකල කාර්යයක් වෙනුවෙන් රු. 32,459 ක්ද, ඇස්තමේන්තුවේ විෂයය අංක 02 යටතේ ටයිල් සැපයීම සහ ඇතිරීම වෙනුවෙන් රු. 50,277 ක් ද ලෙස එකතුව රු. 160,171 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | ජිප්සම් ෂීට් සිවිලිම සඳහා මිල විශ්ලේෂණය කර ඇත්තේ වර්ගමීටර් 57.3 කට බවත්, වැඩ නිමකළ පසු සිවිලිමේ වර්ග ප්‍රමාණය සනමීටර් 73.55 ක ඒකක මිල රු. 3,857.42 ගුණකර ගෙවීම් කර ඇති බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |